## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

# පුරප්පාඩු දැන්වීමයි

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වීමට නියමිතව ඇති අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම සඳහා පහත දක්වා ඇති සුදුසුකම්ලත් වෘත්තිකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| **තනතුරු නාමය** | පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් |
| **සේවා කාලය** | පත්වීම් දින සිට වසර දෙකක් (02) දක්වා |
| **වැටුප් පරිමාණය** | රු. 156,000 - 12 X 4,850 - 214,200 (රා.ප.ච. අං. 10/2025 - SL 3-2025 අනුව) |
| **වයස් සීමාව** | අවුරුදු 55 ට නොවැඩි විය යුතුයි |

**අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්**

01 (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරාවිද්‍යා (විශේෂවේදී) / උරුම කළමනාකරණ ප්‍රථම උපාධිය සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක හෝ විශ්ව විද්‍යාලයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර විස්සක (20) සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සේවය කර තිබීම

හෝ

(ආ) ඉහත විෂයන්ගෙන් ලබා ගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම හා ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) විශිෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියකු වශයෙන් පළපුරුද්දක් තිබීම

02. සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

03. අයදුම්කරුවන්, තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට හැකිවන ලෙස මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

04. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය**

- ඉදිරිපත්වන අයදුම්කරුවන් අතුරින් සුදුසු අයකු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

**වෙනත්**

- තෝරාගත්තා අයදුම්කරුවන් වෙත පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාළව අනුමත කර ඇති දීමනා හා වරප්‍රසාද තනතුර දරන කාල සීමාවට අදාළව හිමි වේ.
- රජයේ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ විශ්ව විද්‍යාලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් සමග තනතුරට තෝරා ගතහොත් නිත්‍ය තනතුරින් නිදහස් කරන බවට තම ආයතන ප්‍රධානියාගේ එකගතාව ඇතුළත් ලිපියක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

මේ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂය පළ කරන අයදුම්කරුවන් තමා විසින්ම සකස් කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් තම සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පිටපත් ද සමග 2025.06.20 දිනට පෙර ලැබෙන ලෙසට **"ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය. අංක 135, අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් **පමණක්** එවිය යුතුය. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවර **"පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය"** ලෙස සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,**
**අංක 135, අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.**